ලිංගික අපරාධයන් සම්බන්ධයෙන් තවමත් ශ්‍රී ලංකාවේ නීති පොත් වල භාවිතා වන්නේ දූෂණය යන යෙදුමයි. එසේම පොදු භාවිතාවේදීද ලිංගික අපරාධයන් පිළිබඳව සඳහන් කිරීමේදී බහුලව යොදාගැනෙන්නේ දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් වෙයි. මෙම යෙදුම් වලින් ගම්‍ය වන්නේ අදාළ වින්දිතයා අපවිත්‍ර වී ඇති බවක් වැනි අදහසක් වන අතර, ලිංගික අපරාධයක වින්දිතයෙකු පිළිබඳව සමාජයේ ඇතැම් තැනක ඇති ගර්හාත්මක හා කොන් කිරීමේ ආකල්පය දුරු කිරීමටද මෙවැනි යෙදුම් වලින්ම් පිටුවහලක් නොලැබෙයි.

එනිසා, දූෂණය හෝ කෙළෙසීම වැනි යෙදුම් වෙනුවට, ලිංගික අපරාධය හෝ බාලවයස්කරුවෙකු සම්බන්ධයෙන් නම් ලිංගික අපයෝජනය වැනි යෙදුම් වඩාත් උචිත වන බව අපි මෙසේ සටහන් කරමු.
#MediaEthicsSL #lka #SinhalaPress #Divaina #Mawbima